මනසා සංවුත්ත ධීරා
Manasa Samvutta Dheera

**දේවි බාලිකා විද්‍යාලය - කොළඹ**

**අවසාන වාර පරීක්ෂණය - 2016 නොවැම්බර්**

**ඉතිහාසය I**

**11 ශ්‍රේණිය** — **කාලය පැය 1 යි.**

සැලකිය යුතුයි :-
* සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට (1) - (2) - (3) - (4) උත්තර වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ උත්තරය තෝරන්න.
(පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.)

---

01) ඉතිහාසඥයින් "ඉතිහාසය" පිළිබඳව විවිධ මත පලකර ඇත. ජී.එම්. ට්‍රෙව්ලියන් ප්‍රකාශ කරන ලද්දේ ඉතිහාසය යනු,
1) ඉතිහාසය තේරුම් ගැනීමට යතුර වශයෙන් අතීතය තේරුම් ගත යුතුය.
2) ඉතිහාසය මිනිසාගේ අතීත සිද්ධි රාශියක එකතුවකි.
3) ඉතිහාසය එක් විෂයයක් නොව විෂයයන් සියල්ල අන්තර්ගත ගෘහයයි.
4) අතීතයද වර්තමානයද අතර සංවාදයකි.

02) ලක්දිව ප්‍රාග් ඓතිහාසික තොරතුරු ලබාගත හැකි ස්ථාන පහත දක්වේ. A හා B තීරු ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| 1 | බෙලි ලෙන | A | බුලත්සිංහල |
| 2 | බටදොඹලෙන | B | කෑගල්ල ප්‍රදේශයේ |
| 3 | පාහියංගල ලෙන | C | කිතුල්ගල |
| 4 | අත්තනගොඩ අළුලෙන | D | රත්නපුර ප්‍රදේශයේ |
| | | E | කුරුවිට ආසන්නයේ |

1) C E B D  2) C E A B  3) E C A B  4) C E D B

03) ඓතිහාසික තොරතුරු අනුව දස මහා යෝධයන්ගෙන් දුටුගැමුණු රජුට ජයගැනීමට සිදුවූ සේවය විස්තර වන්නේ,
1) ගොඩවාය ටැම් ලිපිය
2) බදුලු ටැම් ලිපිය
3) මිහින්තලය හා අභයගිරිය පුවරු ලිපිවලිනි.
4) සිතුල්පව්ව හා සංඛපාල විහාර සෙල්ලිපි වලිනි.

04) වසර දොළොස්දහස් පන්සියයකට පෙර කාලවකවානුවකදී පුළුස්සා ආහාරයට ගන්නා ලද කැළෑදෙල් ඇට පිළිබඳ සාක්ෂි හමුවන ස්ථානයකි.
1) බටදොඹ ලෙන
2) පාහියන්ගල ලෙන
3) බෙලිලන්බැඳි පැලැස්ස
4) කිතුල්ගල බෙලිලෙන

05) සෙල්ලිපි වල සඳහන් කොට ඇති ආකාරයට විවිධ කාර්යය පදනම් කොටගෙන ක්‍රියාත්මක වූ ගම් වර්ග ඇතුළත් කාණ්ඩය වන්නේ
1) ඔලගම් , නියම්ගම්, කුම්භකාරගාම
2) නියම්ගම්, ගෝපාලගාම, කසිකාරගාම
3) කේවට්ටගාම, ඔලගම්, මණිකාරගාම
4) නියම්ගම්, ජට්ඨාන ගාම, ඔලගම්

06) කිසිම සතෙකු නොමැරිය යුතු යැයි සඳහන් කරමින් පළමුවරට "මාඝාත නීතිය" නමින් නීතියක් පනවන ලද්දේ කුමන රජතුමාද?
1) හතරවන මහින්ද රජු ය.
2) කුටකණ්ණතිස්ස රජු ය.
3) ආමණ්ඩගාමිණී අභය රජු ය.
4) නිශ්ශංක මල්ල රජු ය.

07) ක්‍රි. පූ. 1129 තරම් ඈත කාලවකවානුවකදී කාන්තාවන් විසින් ඇස් පිහාටු වර්ණ කිරීමට භාවිතා කරන ලද ලෝහ කූරක් හමුවූ ස්ථානයක් වන්නේ,
1) හල්දුම්මුල්ලය.
2) ඉබ්බන්කටුව සුසානභූමිය ය.
3) යාපහුවේ ගල් සොහොන් කනත්ත ය
4) උඩරංවා මඩමය.

08) භෞතික විද්‍යාත්මක මූලධර්ම පිළිබඳ දැනුම පැරණි ශ්‍රී ලාංකික ඉංජිනේරුවන් සතුව පැවති බවට සාක්ෂි වන්නේ
1) දැදිගම සූතිඝර චෛත්‍යයේ ලෝකඩ ඇත් පහණ
2) රුවන්වැලිසෑය චෛත්‍යයේ අත්තිවාරම සකස්කළ ආකාරය
3) සීගිරිය හා යාපහුව බලකොටු රාජධානි කැනීම.
4) රන්මසු උයන හා පොකුණුවල තාක්ෂණය හා ශිල්පක්‍රම

09) සූප ශාස්ත්‍රයේ දක්ෂ කාන්තාවන් "මධුපාචිකා" යන විශේෂ ගෞරව නාමයෙන් හඳුන්වා ඇති බව සඳහන් වන සාහිත්‍ය මූලාශ්‍රය මින් කුමක්ද?
1) රසවාහිනිය
2) සද්ධර්මාලංකාරය
3) පූජාවලිය
4) සමන්තපාසාදිකාව

10) කෝට්ටෙ රාජධානිය යටතේ රට එක්සේසත් කොට තම මෑණියන් සිහිවීම පිණිස පැමිණියාගෙන් සුනේත්‍රාදේවි පිරිවෙන ඉදිකරන ලද රජතුමා කවුරුන්ද?
1) හතරවන පරාක්‍රමබාහු රජතුමා ය.
2) හයවන පරාක්‍රමබාහු රජතුමා ය.
3) දෙවන පරාක්‍රමබාහු රජතුමා ය.
4) හත්වන බුවනෙකබාහු රජතුමා ය.

11) සීගිරියට නුදුරු අලකොලවැව දෙහිගහ ඇලකන්ද ප්‍රදේශය හා බලංගොඩ සමනල වැව ප්‍රදේශය ඓතිහාසික වශයෙන් වඩාත් වැදගත් වන්නේ,
1) අවමංගල්‍ය චාරිත්‍ර අනුගමනය කිරීම.
2) පිළිස්සූ මැටි වළං භාවිතා කිරීමේ තාක්ෂණය
3) පැරණි යකඩ නිස්සාරණය කිරීමේ තාක්ෂණය
4) ශ්‍රී ලංකාවේ පැරණි වෛද්‍ය තාක්ෂණය

12) සැත්කම් සඳහා භාවිතා කරන ලද ලෝහමය කතුරු හා බෙහෙත් ඇඹරීමට යොදාගත් ඇඹරුම් ගල් සොයාගත් ස්ථානය වන්නේ,
1) ජේතවන කැනීම් වලිනි
2) අභයගිරිය කැනීම් වලිනි.
3) ආලාහන පිරිවෙන කැනීම් වලිනි
4) මැදිරිගිරිය කැනීම් වලිනි.

13) "හිරු එළියෙන් ආවරණය වන පරිදි මඩුවක් යට පමණක් මුලත් වෙළෙඳාම් කළයුතුයි." මෙම නීතිය අතුලත් කර ඇති සෙල්ලිපිය වන්නේ,
1) කළුදිය පොකුණ සෙල් ලිපිය
2) මිහින්තලා පුවරු ලිපිය
3) අභයගිරිය සෙල් ලිපිය
4) සොරබොර වැව ටැම් ලිපිය

14) යාපහුව රාජධානිය සමයේ ගෘහ නිර්මාණ ශිල්පයේ වඩාත් කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ මින් කුමක්ද?
1) ගුප්ත නිර්මාණ ශිල්පයේ බලපෑම
2) දකුණු ඉන්දියානු ගෘහ නිර්මාණ ශිල්පයේ බලපෑම
3) මෞර්ය ගෘහ නිර්මාණ ශිල්පයේ බලපෑම
4) උතුරු ඉන්දියානු ගෘහ නිර්මාණ ශිල්පයේ බලපෑම

15) පහත දක්වා ඇති ස්ථාන අතුරෙන් ප්‍රාග් ඓතිහාසික සුසානභූමි දැකිය හැකි ස්ථාන වන්නේ
1) කිතුල්ගල බෙලි ලෙන හා ඉබ්බන්කටුව
2) ඉබ්බන්කටුව හා බෙල්ලන්බැඳි පැලැස්ස
3) කිතුල්ගල බෙලිලෙන හා රාවණාඇල්ල ලෙන
4) ඉබ්බන්කටුව හා දඹුල්ල ආශ්‍රිත යටිගල්පොත්ත

16) අංග සම්පූර්ණ නගරයක් නිර්මාණය කර, අවුරුදු 70 ක්ම රට පාලනය කළ රජු වන්නේ,
1) දේවානම්පියතිස්ස රජු
2) පණ්ඩුකාභය රජු
3) දුටුගැමුණු රජු
4) ධාතුසේන රජු

17) ඇල මාර්ග තාක්ෂණයේ විශිෂ්ටත්වය ප්‍රදර්ශනය වන අන්තර් ගංගා ද්‍රෝණි ඇල මාර්ගයකට උදාහරණ වන්නේ
1) මිනිපෙ ඇල
2) ජය ගඟ හෙවත් යෝධ ඇල
3) රිදී බැඳි ඇල
4) ඇලහැර ඇල

18) ස්වභාව සෞන්දර්ය හා ජල තාක්ෂණය උපයෝගී කර ගනිමින් සැලසුම් සහගතව නිර්මාණය කරන ලද උද්‍යාන සංකීර්ණයකට නිදසුන් ලෙස දැක්විය හැක්කේ,
1) රන්මසු උයන
2) දීප උයන
3) සීගිරිය උයන
4) මහමෙවුනා උයන

19) පෘතුගීසීන්ගෙන් උඩරටට එල්ලවන ප්‍රහාර මැඩපැවැත්වීම සඳහා පෘතුගීසීන්ට විරුද්ධව සටන් මෙහෙයවූ උඩරට රජු කවුද?
1) පළමු රාජසිංහ රජු
2) විමලධර්මසූරිය රජු
3) සීතාවක රාජසිංහ රජු
4) දෙවන රාජසිංහ රජු

20) පුනරුද සමයේ ඇති වූ දේශගවේශන නිසා යුරෝපීයෝ නව රටවල් සොයා යාමට උනන්දු වූහ. ආරම්භක රටවල් දෙක වන්නේ,
1) ප්‍රංශය, එංගලන්තය
2) ඕලන්දය, ප්‍රංශය
3) පෘතුගාලය, ස්පාඤ්ඤය
4) ස්පාඤ්ඤය, එංගලන්තය

21) තුන්වන උදය රජතුමා විසින් පිහිටුවන ලද "බදුල්ල" ටැම් ලිපියේ වෙළෙඳපොළක් ගැන සඳහන් වේ. එම වෙළෙඳපොළ පිහිටියේ,
1) බණ්ඩාරවෙල ය.
2) හෝපිටිගම ය.
3) හම්බන්තොට ය.
4) තම්මැන්නාගල ය.

22) ගම්පොළ හෙවත් ගඟසිරිපුර අගනගරය කර ගනිමින් ප්‍රථමයෙන් එහි රාජධානියක් පිහිටුවූ රජතුමා වන්නේ
1) තෙවන බුවනෙකබාහු රජු ය
2) පළමුවන බුවනෙකබාහු රජු ය.
3) සිව්වන බුවනෙකබාහු රජු ය.
4) දෙවන බුවනෙකබාහු රජු ය.

23) හයවන පරාක්‍රමබාහු රජුගේ ඇවෑමෙන් කෝට්ටේ රාජධානියේ රාජ්‍යත්වයට පත් වූයේ
1) සුනේත්‍රාදේවියගේ පුතා පරාක්‍රමබාහු කුමරු.
2) කුසුමාසන දේවියගේ පුතා රාජසිංහ කුමරුය.
3) සමුද්‍රා දේවියගේ පුතා ධර්මපාල කුමරුය
4) උලකුඩය දේවියගේ පුතා ජයබාහු කුමරුය.

24) පෘතුගීසීහු ක්‍රි.ව. 1621 දි යාපනය ප්‍රදේශයේ තම බලය පිහිටුවා ගැනීමට ප්‍රධාන වශයෙන් බලපෑවේ කුමක්ද?
1) ස්වභාවික ආරක්ෂාවක් ඔවුන්ට නොතිබීම.
2) පෘතුගීසීන්ගේ දැඩි මර්දනකාරී ප්‍රතිපත්තිය නිසා
3) රාජ්‍ය උරුමක්කරුවන් අතර බල අරගලයක් පැවති නිසා
4) නිත්‍ය හමුදාවක් එහි පාලකයන්ට නොසිටීම.

25) යුරෝපයේ පුනරුද සමයේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වැදගත්ම වෙනසක් ලෙස සැලකෙන්නේ
1) ජාතික රාජ්‍ය බිහි වීම
2) රදළ බලය වැඩිවීම
3) පල්ලියේ බලය වැඩිවීම
4) වංශාධිපතිවරු ප්‍රාදේශීය පාලකයන් වීම.

26) පළමු ලෝක සංග්‍රාමයට ආසන්නතම හේතුව වූයේ
1) යටත්විජිත පිහිටුවීම සම්බන්ධ තරඟයයි.
2) බිස්මාර්ක්ගේ ගිවිසුම් ප්‍රතිපත්තියයි.
3) ඇල්සාස් - ලොරේන් ප්‍රශ්නයයි.
4) ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරුන් ඝාතනය කිරීමයි.

27) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමානුපාතික නියෝජන ක්‍රමයේ ලක්ෂණ පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
A - ඡන්ද අපේක්ෂකයෝ කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් වීම.
B - පක්ෂයට තම ඡන්දය දී කැමති අපේක්ෂකයාට මනාපය ලකුණු කිරීම
C - එක් මැතිවරණ කොට්ඨාශයකට එක් පක්ෂයකින් එක් අපේක්ෂකයෙකු සිටීම.
D - විවිධ ඡන්ද කොට්ඨාශවලට තෝරා ගන්නා මන්ත්‍රීන් සංඛ්‍යාව කල්තියාම තීරණය කිරීම.
1) A, B හා C 2) A, B හා D 3) A, C හා D 4) B, C හා D

28) 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනතා පරමාධිපත්‍යය යනුවෙන් අදහස් වන්නේ,
1) විධායක බලය යි.
2) ව්‍යවස්ථාදායක බලය යි.
3) උත්තරීතර බලය යි
4) අධිකරණ බලය යි.

29) මතු දක්වෙන කරුණු අතරින් කාර්මික විප්ලවයේ යහපත් ප්‍රතිඵල පමණක් අඩංගු පිළිතුර වන්නේ කුමක්ද?
A - ප්‍රධාන නගර ආශ්‍රිත ජනාකීර්ණ වීම
B - රෙදිපිළි කර්මාන්ත අංශයේ කැපී පෙනෙන දියුණුවක් ඇතිවීම.
C - කාන්තාවන් හා ළමුන් ශ්‍රමය විකුණන්නන්බවට පත්වීම
D - ජෝර්ජ් ස්ටීවන්සන් විසින් දුම්රිය එන්ජිම සොයාගැනීම
1) A හා B 2) B හා C 3) C හා D 4) B හා D

30) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ රටවල් 15 ක සාමාජිකත්වයක් ඇත. එයින් "නිශේධ බලය" හිමි "නිත්‍ය සාමාජිකත්වය" දරණ රටවල් 5 කුමක්ද?
1) ඇමෙරිකා එක්සත් ජනපදය, චීනය, රුසියාව, ජර්මනිය, ජපානය
2) රුසියාව, ජපානය, ප්‍රංශය, චීනය, බ්‍රිතාන්‍ය
3) චීනය, රුසියාව, බ්‍රිතාන්‍ය, ඇමෙරිකා එක්සත් ජනපදය, ප්‍රංශය
4) ජපානය, ප්‍රංශය, කැනඩාව, රුසියාව, බ්‍රිතාන්‍යය

31) ලෝකයේ ධනපති පන්තිය හා කම්කරු පන්තිය වශයෙන් සමාජ බෙදීමක් ඇතිවීමට බලපෑ ඓතිහාසික සිද්ධිය වන්නේ,

1) යුරෝපයේ පුනරුදයයි.
2) යුරෝපයේ වැඩවසම් ක්‍රමයයි.
3) බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවයයි.
4) යටත්විජිතවාදී ප්‍රතිපත්තියයි.

32) පළමු ලෝක මහා සංග්‍රාමය නිමාවෙන් පසුව 1919 පිහිටුවාගත් ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතුව වන්නේ,

1) යුද්ධයක් වළක්වා ගැනීම සඳහා අවශ්‍යය බලය හා ශක්තිය සංගමය සතු නොවීම.
2) ලෝක සාමය ආරක්ෂා කර ගැනීමට රටවල් සාමූහිකව කටයුතු නොකිරීම.
3) බලවත් රටවල් ආරක්ෂාව සඳහා ආයුධ සන්නද්ධ වීම.
4) ජර්මනිය හා ඉතාලිය ජපානය සමඟ රහසිගත ගිවිසුමකට එළඹීම.

33) වර්තමාන ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජාතික වැදගත්කමක් ඇති කරුණක් සම්බන්ධයෙන් වඩා ප්‍රජාතන්ත්‍රවාදී තීරණයක් ගත හැක්කේ,

1) ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් මගිනි.
2) පාර්ලිමේන්තුවේ වාද විවාද මගිනි.
3) ජනමාධ්‍ය තුලින් කෙරෙන අදහස් හා ප්‍රකාශ මගිනි.
4) ජනමත විචාරණයක් මගිනි.

34) ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී මාවතකට යොමු කිරීමට මුල් පියවර ලෙස සැලකෙන්නේ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනාව මින් කුමක්ද?

1) ගම් සභා ක්‍රමය අහෝසි කිරීම
2) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම.
3) උඩරට පහතරට ඒකාබද්ධ කිරීම
4) රාජකාරි ක්‍රමය අහෝසි කිරීම

35) රුසියාවේ ඒකාධිපති පාලනයට එරෙහිව ගොවි, කම්කරු ජනතාව රජයට විරුද්ධව ගෙන ගිය අරගලයේ තේමාව මින් කුමක්ද?

1) ''නියෝජිතයන් නැත්නම් බදුත් නැත''
2) ''පන්ති රහිත සමාජයක්''
3) ''නිදහස, සමානාත්මතාවය, සහෝදරත්වය''
4) ''සාමය, ඉඩම් හා ආහාර''

36) ක්‍රි.ව. 1789 සිදු වූ ප්‍රංශ විප්ලවයට බලපෑ ආර්ථික හේතුවක් වන්නේ

1) සතුරන් මැඩීමට රාජ්‍ය බලය යොදා ගැනීම
2) ප්‍රංශ භාණ්ඩාගාරය බංකොලොත් වීම.
3) ඇමෙරිකානු නිදහස් සටනේ බලපෑම
4) මධ්‍යම පාන්තිකයන්ට සමාජයේ තැනක් හිමි නොවීම

37) සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ලංකාවේ අග්‍රාණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ

1) ජනාධිපති විසිනි
2) ආණ්ඩුකාරවරයා විසිනි.
3) බ්‍රිතාන්‍ය රැජින විසිනි.
4) අගමැති විසිනි

38) පුනරුද සමයේ දේශගවේෂනවල යෙදුන නාවිකයන්ට සුරක්ෂිත බව තහවුරු කර ගැනීම සඳහා පහත දැක්වෙන කුමන උපකරණ දායක වීද?

1) වාෂ්ප එන්ජිම හා දුරේක්ෂය
2) මාලිමා යන්ත්‍රය හා උතුරු තරු මාපකය
3) වාෂ්ප එන්ජිම හා මාලිමා යන්ත්‍රය
3) දුරේක්ෂය හා උතුරු තරු මාපකය

39) තම බලය ව්‍යාප්ත කිරීම සඳහා දෙවන ලෝක යුද්ධ සමයේ ''ගෙස්ටා පෝ'' නමින් රහස් පොලිසියක්ද, ''එස් එස්'' නමින් රහස් හමුදාවක් ද යොදාගත් ජර්මන් නාවිකයා කවුද?

1) ඔටෝ වොන් බිස්මාක්
2) බෙනිටෝ මුසෝලිනි
3) වී අයි ලෙනින්
4) ඇඩොල්ෆ් හිට්ලර්

40) බ්‍රිතාන්‍යයන් ආරම්භ කළ වතු වගාව නිසා උඩරට ජනතාවට මුහුණදීමට සිදුවූ බලවත්ම ගැටළුව සේ සැලකිය හැක්කේ මින් කුමක්ද?

1) උඩරට ප්‍රදේශවල පැවති සමාජ සංස්කෘතික සාරධර්ම පිරිහීම.
2) වතු වගාව සඳහා උඩරට වනාන්තර එළි කිරීම නිසා ඇතිවූ පාංශු ඛාදනය.
3) මුඩුබිම් පනත මගින් උඩරට ඉඩම් රජයට පවරා ගැනීම නිසා ඇතිවූ ඉඩම් ප්‍රශ්නය
4) දකුණු ඉන්දියානුවන් වතු කම්කරුවන් ලෙස යොදවා ගැනීම.

The National e-Learning Portal for The General Education

## දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
## අවසාන වාර පරීක්ෂණය - 2016 නොවැම්බර්
## ඉතිහාසය II
**11 ශ්‍රේණිය** කාලය පැය 3 යි.

සැලකිය යුතුයි :-
- ★ I කොටසේ පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- ★ II කොටසින් ප්‍රශ්න හතරක් ද, III කොටසින් එක් ප්‍රශ්නයක් බැගින් තෝරාගෙන ප්‍රශ්න හයකට පිළිතුරු සපයන්න.

---

01) අ) පහත (I) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (II) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම ලෝක සිතියම් කොටසෙහිද ලකුණු කර නම් කරන්න.

i) මහාතිත්ථ, කෝට්ටේ, දේවනගර, සිදුරන්ගල, බූන්දල, බටදොඹලෙන, ගාල්ල, කුදිරමලෙයි, කලා ඔය, මුලතිව්, මහනුවර, කසබ නගර ( ල. 12)

ii) ස්පාඤ්ඤය, උතුරු මුහුද කොන්ස්තන්තිනෝපල්, හිරෝෂිමා, පර්ෂියන් බොක්ක, මලක්කා සමුද්‍ර සන්ධිය ( ල. 6)

ආ) i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ ස්ථාන හා පුද්ගලයන් අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A ක්‍රි.ව. 1895 ගුවන් විදුලි තරංග මගින් පණිවුඩ යැවීමේ ක්‍රමය සොයා ගත් පුද්ගලයා

B ශ්‍රී ලංකාවේ බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි බැතිමතුන්ගේ සහජීවනය පිළිබිඹු වන පොදු ආගමික ස්ථානය කුමක්ද?

C ක්‍රි.ව. 1594 දී දන්තුරේ සටනේ දී පෘතුගීසින් අන්ත පරාජයට පත්කළ රජතුමා

D විදේශ වලින් ආනයනය කරන ලද මැටි භාණ්ඩ, පබළු ආදි දේ සොයාගත් ස්ථානයක් වන්නේ.

A



B



ii) 1. A යාබද රූපයෙන් දක්වෙන්නේ කුමක්ද?
2. මෙය ගොඩනගා ඇත්තේ කුමන ගංගාව හරහාද?
3. මෙය නිර්මාණය කිරීමට යොදාගත් තාක්ෂණය කුමක්ද?
4. මෙම නිර්මාණයට යොදාගත් ද්‍රව්‍ය කුමක්ද?

iii) 1. B රූපයේ දක්වෙන පුද්ගලයාගේ නම කුමක්ද?
2. මොහුගේ දාර්ශනික මතවාද බලපෑ විප්ලවය කුමක්ද?
3. මොහු විසින් රචනා කරන ලද කෘතිය කුමක්ද?
4. ඔහු බලය බෙදා දක්වූ අංශ නම් කරන්න.

02) i) ශ්‍රී ලංකාවේ මනුෂ්‍ය පැවැත්මේ ඉතිහාසය බෙදා දැක්විය හැකි අවදි තුන නම් කරන්න.
ii) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ජනාවාස වල මූලික ලක්ෂණ දෙකක් දක්වන්න.
iii) ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ ස්වභාවික ගල් ගුහා හා එළිමහන් කඳවුරු දෙකක් දක්වා එහි ස්වභාවය විස්තර කරන්න.
iv) මුල් ඓතිහාසික යුගයේදී ජනාවාස වියළි කලාපයේ ව්‍යාප්ත වීමට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න.

03) i) පැරණි සෙල්ලිපිවල මෙන්ම අටුවා කථාවල සඳහන් පරිදි
A ගමිකගේ කාර්යභාරය
B පරුමකගේ කාර්යභාරය
C මපරුමුකගේ කාර්යභාරය

ii) ඓතිහාසික මූලාශ්‍ර වලට අනුව මෙරට ප්‍රථම පාලකයා වූ පණ්ඩුකාභය රජු ඉටුකළ සේවාවන් දෙකක් දක්වන්න.
iii) පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ලැබුණු ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් විස්තර කරන්න.
iv) රාජ්‍යත්ව සංකල්පය ආරම්භ වී දේශපාලන බලය මධ්‍යගත වීමේදී මහ රජු (මපරුමක) ජනතාව වෙනුවෙන් ඉටුකළ යුතුකම් තුනක් පැහැදිලි කරන්න.

04) i) ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ පැවති ප්‍රධාන ආර්ථික කටයුතු තුන නම් කරන්න.
ii) බුදුදහම මෙරට මුල්බැසගත් අවදියේදී පැවති ආගම් දෙකක් නම් කරන්න.
iii) බුදු දහම මෙරට සමාජයේ මුල්බැසගත් අවදියේදී පැවති ආගම් දෙකක් විස්තර කරන්න.
iv) ඉතාමත් ඈත කාලයක සිට ශ්‍රී ලංකාවේ ජනවර්ග අතර සහජීවනය ඉතා ඉහල මට්ටමකින් පැවති බව කරුණු 3 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

05) i) පූර්ව ඓතිහාසික යුගයේ පැවති විද්‍යාත්මක අදහස්වල ස්වරූපය පිළිබිඹු වන අවස්ථා 3 ක් නම් කරන්න.

ii) ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ විසූ ජනතාවට මුහුණ දීමට සිදුවූ අභියෝග 2 ක් සඳහන් කරන්න.

iii) වියලි කලාපයේ ජනපද පිහිටුවූ ජනතාව මුහුණදුන් අභියෝග ජයගැනීමට යොදාගත් උපක්‍රම 2 ක් පැහැදිලි කරන්න.

iv) අනුරාධපුර පොලොන්නරු යුගවල සිටි විවිධ ශිල්පීන් විශිෂ්ට වාස්තු විද්‍යාත්මක නිර්මාණ කර ඇති බව නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 6)

06) i) පුරාණයේ බදු නීතිය යටතේ අය කළ බදු වර්ග තුනක් නම් කරන්න.

ii) ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් හමුවූ විදේශීය කාසි වර්ග 2 ක් සඳහන් කරන්න.

iii) පුරාණයේ ශ්‍රී ලංකාවේ සමාජය කාන්තාව පිළිබඳව ගෞරවයෙන් කටයුතු කළ බවට සාක්ෂි 2ක් විස්තර කරන්න.

iv) පරිසරය, කෘෂිකර්මය හා වෙළෙඳාම මැනවින් පවත්වාගෙන යාමට පුරාණයේ පැන වූ නීති එක බැගින් පැහැදිලි කරන්න.

07) i) පෙරදිගට පැමිණි යුරෝපා ජාතීන් පිහිටුවාගත් වෙළෙඳ සමාගම් තුන නම් කරන්න.

A - පෘතුගීසි

B - ලන්දේසි

C - ඉංග්‍රීසි

ii) පහත සඳහන් බ්‍රිතාන්‍ය ජාතිකයන් උඩරටට පැමිණෙන විට එහි සිටි පාලකයින් නම් කරන්න.

1. ක්‍රි.ව. 1762 - ජෝන් පයිබස්

iii) ක්‍රි. ව. 1818 ප්‍රථම නිදහස් සටනේ ප්‍රතිඵල දෙකක් විස්තර කරන්න.

iv) ක්‍රි. ව. 1848 දෙවන නිදහස් සටනට කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ හේතු වූ ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

## III කොටස

08) i) කාර්මික විප්ලවය මූලික වශයෙන් ආරම්භ වූ කර්මාන්ත ක්ෂේත්‍ර තුන නම් කරන්න

ii) කාර්මික විප්ලවය ප්‍රථමයෙන්ම එංගලන්තයේ ආරම්භ වීමට පසුබිම් වූ හේතු දෙකක් සඳහන් කරන්න.

iii) ප්‍රවාහන ක්ෂේත්‍රයේ වෙනස්කම් ඇති කිරීමට කාර්මික විප්ලවය දායක වූ ආකාරය ඊට අදාල නව සොයා ගැනීම් දෙකක් ඇසුරින් විස්තර කරන්න.

iv) කාර්මික විප්ලවය නිසා යහපත් මෙන්ම අයහපත් ප්‍රතිඵල ද උදා වී ඇත. මේ බව නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

09) i) පහත A, B, C යටතේ දක්වා ඇති තොරතුරු වලට අදාල පුද්ගලයා නම් කරන්න

A - "සමාජ සම්මුතිය" කෘතිය ලියූ දාර්ශනිකයා

B - "රජය නම් මමයි" ප්‍රකාශය කළ රජු

C - "නීතියේ සාරය" කෘතිය ලියූ දාර්ශනිකයා

ii) ක්‍රි. ව. 1789 දී ප්‍රංශ විප්ලවය නිසා ප්‍රංශයේ ඇති වූ වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

iii) පළමු ලෝක මහා සංග්‍රාමයේ චූදිතයා වූ ජර්මනියට වර්සෙල්ස් ගිවිසුමෙන් පැනවූ දැඩි දඬුවම් දෙකක් විස්තර කරන්න.

iv) ක්‍රි.ව. 1945 දී අවසන් වූ දෙවන ලෝක මහා සංග්‍රාමය නිසා ඇතිවූ ප්‍රතිඵල තුනක් දක්වා ඒවා පැහැදිලි කරන්න.